# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1981/33 - 2016 අගෝස්තු මස 23 වැනි අඟහරුවාදා - 2016.08.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මෝටර් රථ ප්‍රවාහන පළාත් කොමසාරිස් කාර්යාලය (බස්නාහිර පළාත)

### යෝග්‍යතා සහතික නිකුත් කිරීම සඳහා මෝටර් ගරාජයක් ලියාපදිංචි කිරීම

මහජන සේවාවන් සඳහා යොදනු ලබන (බස්රථ සහ ලොරි ආදී) වෙළඳ වාහන වෙනුවෙන් යෝග්‍යතා සහතික නිකුත් කිරීම පිණිස බස්නාහිර පළාත තුළ පිහිටි පහත සුදුසුකම් හා පහසුකම් සපුරන මෝටර් ගරාජ වාර්ෂිකව ලියාපදිංචි කරනු ලැබේ. අයදුම්කරුවන් සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත තමන්ගේ ව්‍යාපාරය ලියාපදිංචිකර තිබිය යුතු අතර අදාළ පළාත් පාලන ආයතනය වෙත වරිපනම් බදු සහ/හෝ රජය හා පළාත් සභාව විසින් කලින් කලට පනවනු ලබන බදු හා ගාස්තු ගෙවන්නන් විය යුතුය.

1. **''ඒ'' ශ්‍රේණියේ මෝටර් ගරාජයක් සඳහා ඉල්ලුම්කරුවන් වෙත තිබිය යුතු සුදුසුකම් :**

1.1 පහසුකම් :

I. අඩි 20 ක් දිග අඩි 2 1/2 ක් පළල අඩි 4 1/2 ක් ගැඹුරැති වලක් හෝ වාහන පරීක්ෂා කිරීමට ඒ හා සමාන පහසුකම් සැපයෙන පරීක්ෂණ වේදිකාවක් හෝ ඔසවනයක්.
II. ටැප්ලි මීටරයක් හෝ රෝලර් බ්‍රේක් ටෙස්ටරයක්.
III. ප්‍රධාන ලාම්පු පරීක්ෂා කිරීමට උපකරණයක් හෝ සුදුසු ස්ථානයක් සමග බෝඩ් එකක්.
IV. පරීක්ෂණ ලාම්පුවක්.
V. පරීක්ෂණ කටයුතු සඳහා යතුරු කට්ටලයක්. (සම්මත ප්‍රමාණවලට අනුව සෑම ප්‍රමාණයකම යතුරු සහිතව)
VI. එලයින්මන්ට් ගේජ් එකක්.
VII. විදුලි හා ගෑස් වෑල්ඩින් උපකරණ.

1.2 සහතික කිරීමේ නිලධාරි සහ කාර්යය මණ්ඩලය :

(i) යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාවෙන්, තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා සහතිකය හෝ කණිෂ්ඨ කාර්මික නිලධාරි සහතිකය ලබා තිබීම.

හෝ

(ii) ඉහත (i) හි සඳහන් පාඨමාලාවට සමාන ලන්ඩන් සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් ආයතනය මගින් ප්‍රදානය කෙරෙන මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ සම්පූර්ණ තාක්ෂණික සහතිකය ලබා තිබීම.

සහ

පිළිගත් මෝටර් ගරාජයකින් යටත් පිරිසෙයින් අවුරුදු 2ක කාර්මික පළපුරුද්දක් තිබීම. (මෝටර් වාහන ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විදේශ පුහුණුව ලබා ඇති අය සහ මෝටර් කාර්මික විද්‍යාව පිළිබඳ ජර්මන් කාර්මික විද්‍යාල සහතිකය ලබා රජයේ පිළිගත් ආයතනයක මෝටර් කාර්මික විද්‍යාව පිළිබඳ වසර 15 කට වැඩි පළපුරුද්දක් ඇති අය ඔවුන්ගේ සුදුසුකම් අනුව ඉහත කී අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කිරීම පිළිබඳව සළකා බලනු ලැබේ.)

(iii) සහතික කිරීමේ නිලධාරි සතුව බර වාහන පැදවීම සඳහා වලංගු රියදුරු බලපත්‍රයක් තිබිය යුතුය.
(iv) සහතික කරන නිලධාරියා ගරාජයේ ස්ථිර සේවකයෙකු විය යුතු ය.
(v) ගරාජය භාරව අඩුම වශයෙන් එක් කළමණාකරුවකු සමග අවශ්‍ය කාර්යය මණ්ඩලයක් සිටිය යුතුය.

2. "බී" ශ්‍රේණියේ මෝටර් ගරාජයක් සඳහා තිබිය යුතු සුදුසුකම් :

2.1 පහසුකම් :

I. අඩි 20 ක් දිග අඩි 2 1/2 ක් පළල අඩි 4 1/2 ක් ගැඹුරැති වලක් හෝ වාහන පරීක්ෂා කිරීමට ඒ හා සමාන පහසුකම් සැපයෙන් පරීක්ෂණ වේදිකාවක් හෝ ඔසවනයක්.
II. ටැප්ලි තිරිංග පරීක්ෂා කිරීමේ උපකරණයක්.
III. ප්‍රධාන ලාම්පු පරීක්ෂා කිරීමට උපකරණයක් හෝ සුදුසු ස්ථානයක් සමග බෝඩ් එකක්.
IV. පරීක්ෂණ කටයුතු සඳහා යතුරු කට්ටලයක්. (සම්මත ප්‍රමාණවලට අනුව සෑම ප්‍රමාණයකම යතුරු තිබිය යුතුය)

2.2 සහතික කිරීමේ නිලධාරි සහ කාර්යය මණ්ඩලය :

(i) යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාවෙන්, තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා සහතිකය හෝ කණිෂ්ඨ කාර්මික නිලධාරි සහතිකය ලබා තිබීම.

හෝ

(ii) ඉහත (i) හි සඳහන් පාඨමාලාවට සමාන ලන්ඩන් සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් ආයතනය මගින් ප්‍රදනය කෙරෙන මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ සම්පූර්ණ තාක්ෂණික සහතිකය ලබා තිබීම.

සහ

පිළිගත් මෝටර් ගරාජයකින් යටත් පිරිසෙයින් අවුරුදු 2ක කාර්මික පළපුරුද්දක් තිබීම. (මෝටර් වාහන ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විදේශ පුහුණුව ලබා ඇති අය සහ මෝටර් කාර්මික විද්‍යාව පිළිබඳ ජර්මන් කාර්මික විද්‍යාල සහතිකය ලබා රජයේ පිළිගත් ආයතනයක මෝටර් කාර්මික විද්‍යාව පිළිබඳ වසර 15 කට වැඩි පළපුරුද්දක් ඇති අය ඔවුන්ගේ සුදුසුකම් අනුව ඉහත කී අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කිරීම පිළිබඳව සළකා බලනු ලැබේ.)

(iii) සහතික කිරීමේ නිලධාරි සතුව බර වාහන පැදවීම සඳහා වලංගු රියදුරු බලපත්‍රයක් තිබිය යුතුය.

3. **A ශ්‍රේණියේ හා B ශ්‍රේණියේ ගරාජයක පරීක්ෂා කළ හැකි වාහන කාණ්ඩ පහත පරිදි වේ :-**

| *A ශ්‍රේණියේ ගරාජයකින් පරීක්ෂා කළ හැකි වාහන* | *B ශ්‍රේණියේ ගරාජයකින් පරීක්ෂා කළ හැකි වාහන* |
|---|---|
| ඔම්නි බස් | - |
| පුද්ගලික කෝච් | පුද්ගලික කෝච් |
| මෝටර් ලොරි | මෝටර් ලොරි |
| ගිලන්රථ, අවමංගල රථ | ගිලන්රථ, අවමංගල රථ |
| ලොරි ට්‍රේලර් | ලොරි ට්‍රේලර් |
| විශේෂ කාර්ය වාහන | විශේෂ කාර්ය වාහන |
| ට්‍රයිසිකල් වෑන් | ට්‍රයිසිකල් වෑන් |

පහත සඳහන් ලියවිලි අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය ඃ

i. සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් ගරාජය ලියාපදිංචි කළ සහතිකයේ පිටපතක්.
ii. අදාළ පළාත් පාලන ආයතනයට වරිපනම් බදු/ව්‍යාපාර බදු ගෙවූ ලදුපත් පිටපතක්.
iii. නගර මධ්‍යයේ සිට නියම පිහිටීම/ගරාජයට ළඟාවන මාර්ගය දක්වෙන දළ සටහනක්.
iv. යෝජිත සහතික කිරීමේ නිලධාරීන්ගේ සුදුසුකම් සහ ඔවුන්ගේ සහතිකවල ඡායා පිටපත්.
v. ආපසු නොගෙවන තැන්පත් මුදල වශයෙන් කලින් කලට ප්‍රසිද්ධ කරන ලද ගාස්තුව මෙම කාර්යාලයට ගෙවා ලබාගත් බවට බප 1 රිසිට්පත.

දැනටමත් ලියාපදිංචි වී ඇති ගරාජයන්හි පිහිටීම හා පරීක්ෂණ නිලධාරි වෙනස් නොවන්නේ නම් ඉහත (iii) හා (iv) ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

ලලිත් වනිගරත්න,
පළාත් මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ,
නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත
හා ග්‍රාම සංවර්ධන පිළිබඳ ගරු අමාත්‍යතුමා.

2016 අගෝස්තු මස 23 දින,
පළාත් මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ,
නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත
හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය, (බස්නාහිර පළාත),
අංක 89, 4 වන මහල,
''රන්මගපාය'',
කඩුවෙල පාර, බත්තරමුල්ලේ දී ය.

09 - 250

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.